නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගත් රු.3,311,756 ක් වටිනා ස්ථාවර වත්කම් 28 ක් ගබඩා තොග ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම සහ ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂවලදී සමීක්ෂණය කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, | | | |
| | 880 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් අනුයුක්ත කර ඇති නිලධාරින්ගෙන් සේවක ඇප සභාවට ලැබී නැත. සෙසු නිලධාරින්ගෙන් ඇප මුදල් අය කිරීම ආරම්භ කර ඇත. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව 2010 වර්ෂයට පසුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු ගාස්තු ප්‍රතිශෝධනය කරදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,105,145 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මාස නවයක කාල පරිච්ඡේදය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,981,663 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,480,000 | 2,658,437 | 3,420,547 | 476,558 | 3,288,500 | 1,634,599 | 1,642,112 | 1,021,319 |
| කුලී | 8,215,000 | 7,993,814 | 8,249,482 | 2,191,700 | 1,712,180 | 5,517,280 | 5,858,196 | 2,447,368 |
| බලපත්‍ර ගාස්තු | 2,311,000 | 2,693,871 | 2,693,871 | - | 1,530,000 | 660,500 | 660,500 | - |
| වෙනත් ආදායම් | 3,872,000 | 4,189,923 | 3,238,386 | - | 4,590,000 | - | 135,382 | - |
| | 17,878,000 | 17,536,045 | 17,602,286 | 2,668,258 | 11,120,680 | 7,812,379 | 8,296,190 | 3,468,687 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.1,177,161 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.736,000 ක් අයවිය යුතුව තිබුණි. | මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු හිඟ මුදලින් රු.1,155,828 ක මුදලක් මේ වනවිට ලැබී ඇත. 2019 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළ උපලේඛන ලැබී නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩසටහන් අයවැය ලේඛනයේ දක්වා තිබූ රු.3,150,000 ක් වූ ව්‍යාපෘති 11 ක් 2019 සැප්තැම්බර් 03 දින දක්වා ද ආරම්භ කර නොතිබුණි. | තාත්ත්වික අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වේ. | සභාවේ මූල්‍ය තත්තවයක් නොමැති බැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් රු.9,045,317 ක් වියදම්කොට අර්ධ වශයෙන් ඉදිකර තිබුණු නෝර්වුඩ් ආදාහනාගාරය සභාව වෙත පවරා තිබුණද ඉන්පසු කිසිදු කාර්යක් ඉටුනොකර නිශ්කාර්යව පැවැතුණි. | ව්‍යාපෘතිය නිමකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ආදාහනාගරය භාවිතයට ගැනීමට නුසුදුසු තත්ත්වයෙන් මෙම සභාවට භාරදී තිබූ අතර ඉතිරි වැඩ කොටස් නිම කිරීමට 2020 මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඇස්තමේන්තු සකස්කර ඇති අතර ඉන් පසුව ඉතිරි වැඩ කොටස් නිම කිරීමට නියමිතය. |
| (ii) | බගවන්තලාව කසළ බැහැර කරනු ලබන ඉඩමේ කොම්පොස්ට් ව්‍යාපෘතියක් සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ අරම්භ කර අදාළ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බලප්‍රදේශයේ විධිමත් කසළ කළමනාකරණයක් සිදුකර නොතිබුණි. බගවන්තලාව නගරයේ කසළ බැහැර කරනු ලබන ඉඩමේ මිශ්‍ර කසළ දිනපතා පුළුස්සා ඉතිරි මිශ්‍ර කසළ අවිධිමත්ව එම ඉඩමේ ගොඩගසා තිබුණි. | කසළ කළමනාකරණය විධිමත් කළ යුතු වේ. | කොම්පෝස්ට්කරණය හා නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය සම්පත් හා කාර්යමණ්ඩලය නොමැති වීම නිසා කොම්පෝස්ට් අංගනය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

(ඈ) අනවසර ඉදිකිරීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුළ ඉදිකළ සහ ඉදිකෙරෙමින් පවතින අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබූ අතර ලැබෙන පැමිණිලි සම්බන්ධව ලේඛනගත කිරීමක් ද කිරිමක්ද සිදුකර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ දැනට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී ඒ සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ අදාළ තිරසර සංවර්ධන ඉලක්ක් පිළිබඳ කටයුතු කරන බව. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 20 ක පුරප්පාඩු 78 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආයතනගත තනතුරු සඳහා පවතින පුරප්පාඩු වෙනුවෙන් සම්මුඛ පරික්ෂණ පවත්වා ඇති අතර ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. ආයතනගත නොවන පුරප්පාඩු තනතුරු සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්වරයාට දැනුවත් කර ඇත. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ පවතින සියළුම පොදු වැසිකිළි ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස අබලන්ව හා අපවිත්‍රව අතහැරදමා තිබුණි. | වැසිකිළි පිළිසකර කර ප්‍රයෝජනයට ගත යුතු වේ. | මෙම වැසිකිළි භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කිරීමට කටයුතු කරමින් පවතී. වැසිකිළි විධිමත්ව නඩත්තු කිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වීම නිසා ස්ථිරව කම්කරුවන් යෙදවීමට නොහැකි වී ඇත. |
| (ආ) | බගවන්තලාව සහ පුලියාවත්ත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම<br>2018 මැයි 27 න් පසුව මෙම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන වසාදැමීම නිසා බලප්‍රදේශයේ ජනතාවට ආයුර්වේද ප්‍රතිකාර ලබාගැනීම සම්පූර්ණයෙන්ම ඇනහිට තිබුණි. | මහජනතාවට අවශ්‍ය සේවා සැපයීම සිදුකළ යුතු වේ. | ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ පුරප්පාඩුව පවතින අතර මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරාදෙන ලද ඉඩම් කැබලි 28 න් 26 කට | පිළිතුර අනුව කටයුතු කර වාර්තා කළ යුතු වේ. | දැනට දේපළ දෙකක පිඹුරුපත් සකස් කර ඇත. මේ සඳහා විශාල මුදලක් වැයවන නිසා |

| | | | |
|---|---|---|---|
| | අදාළ ඔප්පු සහ, කැබලි 24 කට අදාළ පිඹුරුපත් සභාවේ නොතිබුණි. | | සභාවේ මූල්‍ය තත්ත්වය අනුව මෙම කාර්යය කොටස් වශයෙන් ඉටු කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) | ඉඩම් කැබලි 20 ක වපසරිය හඳුනාගෙන නොතිබුණි. | පිළිතුර අනුව කටයුතු කර වාර්තා කළ යුතු වේ. | අදාළ ඉඩම් කැබලි හඳුනාගනිමින් පවතී. |

3.4.1 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **රවීන්ද්‍රන් ළමා උද්‍යානය**<br>පුලියාවත්ත කාර්යාල ඉඩමට යාබදව පර්චස් 40 ක පමණ වපසරිය සහිත රවීන්ද්‍රන් ළමා උද්‍යානය වසර 10 කින් පමණ ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබෙන අතර, උද්‍යාන භූමියේ තණකොළ වැවී උපකරණ කැඩී අබලන්වී පැවතුණි. | ඉදිරියේදී ඵලදායීලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ආ) | හොන්සි - පුලියාවත්ත කැළි කසළ ගබඩා මධ්‍යස්ථානය, බගවන්තලාව සෝගාතක ඉඩම, කොටියාගල වත්තේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල, නෝර්වුඩ් නගරයේ පොලිසිය අසළ ඉඩම, එළුමස් කඩය හා ඉඩම, සේවා කාමරය හා ඉඩම යන දේපළ නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ඵලදායීලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නොතිබුණි. |

3.4.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කෲ කැබ් රථයේ මයිලෝ මීටර් වසරකට අධික කාලයක සිට ක්‍රියා විරහිතව තිබුණි. | මයිලෝ මීටරය අළුත්වැඩියා කළ යුතු වේ. | මයිලෝ මීටරය සවි කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | සභාවට අයත් වාහන 03 කට අදාළව 2019 වර්ෂයේ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම වාහන 03 | පිළිතුර අනුව ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | මෙම ධාවන සටහන් 2020 ජුනි 10 වන දිනට පෙර විගණනයට |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉන්ධන සඳහා රු. 854,478 ක් වැයකර තිබුණි. ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම නිසා මෙම ඉන්ධන වියදම් රාජකාරි කටයුතු සඳහා දරණ ලද වියදම් බව විගණනයට සනාථ කරගත නොහැකිවිය. | | ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාපතිවරයාගේ පරිහරණය සඳහා කුලී පදනම මත ලබාගෙන තිබුණු වාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කුලී වශයෙන් රු.2,606,853 ක් වැයකර තිබුණි. මෙම මුදල් යොදවා කල්බදු ක්‍රමයට වාහනයක් මිළදී ගත්තේ නම් අදාළ කාල සීමාව අවසානයේ අයිතිය සභාවට ලැබෙන බැවින් කුලී පදනමට වඩා වාසිදායක විය හැකිව තිබුණි. | සභාවට සුදුසු කැබ් රථයක් මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව සභාපතිවරයා දැනුවත් කර ඇත. |

4. අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි අභ්‍යන්තර විගණනය විධිමත් කිරිමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නොතිබුණි. |